දහයක පමණයයි කිවහැකි  අඩු වේගයකින් ධාවනය විය. එකළ කොස්ගම තිබුණු තුනී ලෑලි කර්මාන්ත ශාලාව සඳහා  දුම්රියෙන් ප්‍රවාහනය කළ ඉන්ධන සහ වෙනත් ද්‍රව්‍ය බෑම සඳහා පැය භාගයකට වඩා කල් ගතවූ නිසා දුම්රිය  අවිස්සාවේල්ලට ළඟාවන විට මධ්‍යාහ්න දොළහද පසුවිය. දුම්රිය අඩු වේගයකින් යාම නිසා අපට නම් වට පිට දේවල් බලාගැනීමට හැකිවූ නිසා එය ඉතාමත් ප්‍රියජනක විය. අවිස්සාවේල්ලේදී විවිධ භාණ්ඩ පැටවූ මැදිරි හුවමාරුවක් තිබුණු නිසා තවත් පැය භාගයක පමණ ප්‍රමාදයක් වන බව දැන ගතිමු.

මෙසේ දුම්රිය නතරකර තිබියදී අප විසින් ගෙනෙන ලද බත්මුල් ලිහා ගෙන දහවල් ආහාරය ගතිමු. කැකුළු හාලේ බත් සමග බැදපු හාල්මැස්සන්, තෙලට පිසින ලද පරිප්පු සහ මුකුණුවැන්න මැල්ලුම නිසා කෑම වේල ඉතාම ප්‍රිය ආහාරයක් විය.

රබර් වතු සහ තේ වතු හරහාද, සොබා සිරියෙන් අනුන ගම්මාන මැදින්ද ඉබි ගමනින් ඇදීගිය දුම්රිය රත්නපුරයට පැමිණෙන විට සවස තුන පසුවී තිබිණ.

අප මැදිරියේ සිටි වෙළෙන්දෝ තම බඩු භාණ්ඩද රැගෙන රත්නපුරයෙන් බැස ගත්හ. මැණික් ගැරීමට යයි සිතිය හැකි ආම්පන්නද රැගෙන පැමිණි  තරුණයින් පිරිසක් රත්නපුරයේදී අප සිටි මැදිරියට ගොඩවුහ. ඔව්හු මැණික් පතල්, ඉල්ලම් කැඩීම, දෝනා යාම, කරු හවුල් ගැනීම යනාදී වශයෙන් කතාබස් කළ බොහෝ දේ අපට හරිහැටි තේරුම් ගන්නට නොහැකි  විය.

රත්නපුර දුම්රිපොල පසුවී විනාඩි කිහිපයකින් දුම්රිය, කළු ගඟෙහි වරකාතොට පාලම පසුකරන විට ඇතිවූ ගැස්සීම සහ කම්පනය නිසා අපට තරමක බියක්ද ඇතිවිය. විශාල ජල ධාරාවක් ගලායන කළු ගඟෙහි නියම ස්වරූපය ඉතා හොඳින් දැක ගන්නට ලැබුණේ එදාය. දුම්රිය කවුළුවෙන් පිටතට එබී බලන විට පහලින් පෙනුණු ගඟ දිස්වූයේ කළු පැහැයෙනි. කළු ගඟට එම අන්වර්ථ නාමය ලැබී ඇත්තේ මෙම කළු පැහැය නිසා බව අපට පහසුවෙන්ම ඒත්තු ගැනීමට හැකිවිය.

රත්නපුරයේ සිට කහවත්ත  දක්වා ගමනේදී



V2 331 පැරණි වාෂ්ප දුම්රිය එන්ජිම සහ සම්බන්ධ මැදිරි.

ඇස දිසි  මානයේ විසිරී තිබුණු  මැණික් පතල් සහ කඳු බෑවුම් වල 'terrace' ආකාරයට සකස්  කරන ලද සරු සාර කුඹුරු යායවල්ද දකින්නට ලැබුණි. මැණික් පතල් වල සුවිශේෂී ලක්ෂණයක් වනුයේ ඒ අසලම පොල් අතු සෙවිලි කර සකස් කර තිබුණු කුඩා මඩු වැනි වාඩි සමූහයයි. ඒ ගැමි පරිසරය තවත් ඔපවත් කිරීමට මැණික් පතල් සහ වාඩි වලින් ලැබෙනුයේ මහත් රුකුලකි. කහවවත්තෙන් පසු දුම්රිය මාර්ගයද කඳු සහ වංගු වලින් යුක්ත වූ නිසා වේගය තවත් අඩුවූ බව දැනුනි.

අපට සවස පහමාර පමණ වනවිට අවසාන දුම්රිපළ වන ඕපනායකට යාමට හැකිවිය. අමරසේන මහතා අප පිළිගැනීමට දුම්රියපළට පැමිණ සිටියේය.

අප දුටු විගසම සිනාමුසු මුහුනින්, ආයුබෝවන්  කියා අප පිළිගත් ඔහු

"අද කෝච්චිය ඉක්මනට ආවා. සමහර දාට පැය පහක් හයක් ප්‍රමාද වෙනවා. අද ප්‍රමාද උනේ පැය භාගයක් විතර"

මම මගේ  මිතුරන් දෙදෙනා වන අතපත්තු සහ පතිරාජ ඔහුට හඳුන්වා දුනිමි.

"මාත් එක්ක ගුරු විද්‍යාලයයේ හිටපු අතපත්තු කියන මහත්මයෙක් දැන් බණ්ඩාරගම පැත්තේ වීදාගම ඉස්කෝලේ විදුහල්පති" යයි ඔහු එක් වරටම කීවේය.

"ඒ අපේ බාප්පා" අතපත්තුගේ පිළිතුර විය.
"මටනම් කාලෙකින් හමු උනේ නැහ" ඔහු කිවේය.

දැන් අමරසේන මහත්මයාට අතපත්තු සමගද ඔහුගේ ඥාතියා හරහා කිට්ටු සම්බන්ධයක් තිබේ.

දුම්රියපළේ සිට කිලෝමීටර භාගයක් පමණ දුරින් වූ, ඔහු පදිංචිව සිටි පාසලේ ගුරු නිවාසය වෙත අපි පයින්ම ගියෙමු. ටික වෙලාවක් ආගිය තොරතුරු කතාකිරීමෙන් පසු  ඔවුහු  අපට බෙලිමල් තැම්බූ වතුර සහ කිතුල් හකුරු වලින් සංග්‍රහ කළහ. ගමන් විඩාව සංසිඳවීම සඳහා බෙලිමල් වතුර අමෘතයක් වැනි පානයක් විය. රාත්‍රී ආහාරය සඳහාද ඇල් හාලේ බත්, අමු මිරිස් මාළුව, කිරිහොදි, මියන දළු තෙම්පරාදුවක් සහ කරවල බැදුමක් සකස් කර තිබුණි.

අපට රාත්‍රියට නිදා ගැනීම සඳහා ගුරු නිවාසයේ කාමරයක ඇඳන් දෙකක් යාකර පහසුකම් සලස්වා දෙන ලදී.

පසුදින උදයේ අපි අමරසේන මහතා සමග දන්දෙනිය වත්තේ වතු බංගලාව  ට

ගියෙමු. වතු අධිකාරිවරයා  අප සතුටින් පිළිගත්තේය. ඔහුට අප බලාපොරොත්තුවන කාර්යය පිලිබඳ අවබෝධයක් තිබිණ. ඔහු මැට්‍රිකියුලේෂන් විභාගයට උද්භිද විද්‍යාඅව උගත් අයෙකි. ඒ බව අපට කී ඔහු, තමන්ගේ නම ස්ටීවන් බවත් ස්ථිර පදිංචිය මහනුවර බවත් කීවේය. අපට දහවල් ආහාරය සඳහා සැන්ඩ්විච් පාර්සලය බැගින්ද ඔහුගෙන් ලැබිණ. ඒ සමගම අපට උදව් කිරීමට සින්නයියා නම් ඔහුගේ වයස්ගත වතු සේවකයෙකුද  ලබා දුන්නේය. යකඩ උලක් සහ අත් මුල්ලුවක් සමගම අපට බීම

සඳහා   විශාල වතුර බෝතලයක්ද  ඔහුගේ මල්ලේ විය. අප සින්නයියාට භාරකළ අමරසේන මහතා ආපසු ගියේය.

හොඳින් සිංහල කතාකළ  සින්නයියාගේ උච්චාරණය තරමක් වෙනස්ය. ඔහු ඉඳහිට ඉංග්‍රීසියෙන්ද කතා කළේය. ප්‍රියමනාප පුද්ගලයෙකු වූ ඔහු ඉක්මණටම අප සමග කුළුපග විය. තමන් ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ මිනිසෙකු බව කී ඔහු, දැනට වසර හැටක් පමණ වත්තේ ජීවත්වූ බවත්, තම බිරින්දෑ වසර තිහකට පමණ පෙර ගසක දර අත්තක් හිස මත කඩා වැටීම නිසා මියගිය බවත් කඳුළු පිරි දෙනෙතින් යුතුව අමුතු සිංහල උච්චාරණයකින් අප සමග කීවේය. දැනට "පෙරිය දොරේ" ගේ බංගලාවේ වැඩ කරමින් ජීවත් වන බවත් ඔහු තමන්ට ඉතා හොඳින් සලකන බවද ආඩම්බරයෙන් සඳහන් කළේය.  අපට ඔහු ගැන අනුකම්පාවක් ඇතිවිය.

රබර් වත්තේ අඩි පාරක් දිගේ ගිය අප ලඳු කැලෑවක් සහිත මූකලානකට පැමිණියෙමු. මෙහිදී අප නතර කළ සින්නයියා, ඔහුගේ මල්ලෙන් සබන් කෑල්ලක් සහ භාජනයකට වතුර වත්කර



හෝමාගම  සිට අවිස්සාවේල්ල දක්වා ධාවනය වූ අංක . 331, V2  දරණ පැරණි වාෂ්ප රේල් බස් රථය.

"දොරේලා මේ ෂබන් ඔන්දට කකුල් වෙල ගා...ගන්න, කුඩැල්ලෝ ලස්ස ගණන් ඉන්නවා" යයි කිවේය.

මෙය අප කිසිසේත් බලාපොරොත්තු නොවූ දෙයක් විය.

ඔහුගේ උපදෙස් පරිදි සෙරෙප්පු ගලවා දෙපාවල හොඳින් සබන් ගා ගත්තෙමු. ඔහු සබන් දියකළ වතුර සෙරෙප්පු වලටද දැමිය.

ඔහු කුඩැල්ලන් පිළිබඳව අපට තව උපදෙසක් දුන්නේය.

"දොරේලගේ කකුලට කුඩැල්ලෙක් අවොත්.... ඌව ඇඟිලි වලට මිරිකලා පොඩි කරලා වීසි කරන්න. එතකොට .. ඌ  බාගෙ..ට මැරෙනවා .."

අපට කිහිප වරක්ම ඔහුගේ උපදෙස ක්‍රියාත්මක කිරීමට සිදුවිය.

වන වදුලට ඇතුල් වන විටම මල් රාශියක් පිපී තිබුණු නියඟලා වැලක් අපට හමුවිය. මම එයින් මල් සහිත ඉත්තක් කපා ගැනීමට සූදානම් වුයෙමි.

"ෂා..... ෂා ..... මාතියා .... ඕක නම් අල්ලන්නවත් එපා. වෂ ....වෂ...වෂ.."

අපට තරමක බියක්ද ඇතිවිය.

නියඟලා අල කා වත්තේ තරුණියක් දිවි නසාගත් හැටි ඔහු අපට විස්තර කළේය.

කෙසේ වෙතත් අපද ප්‍රවේශමෙන් එයින් මල් සහිත රිකිලි කපා ෆෝමලීන් වල එබූ පුළුන් සහිත පොලිතීන් කවර වලට දමා ගතිමු.

තව ටික දුරක් ගිය විට ඔහු දොළ පාරක් අසල තිබුණු දන් පඳුරකින් ඉදුණු ගෙඩි පොකුර බැගින් අපට කඩා දුන්නේය. අපට එය රසවත් පලතුරක් විය.

අපි ඒ අසලම තිබුණු මීවන වර්ග කිහිපයක්, බාඳුරා, කොක්මොට බිනර වැනි ශාක කිහිපයක් එකතු කර ගතිමු. එතෙක් වේලා අසල තිබුණු ගල් තලාව මත හිඳගත් ඔහු බුලත් විටක් හපන්නට විය.

දොළෙන් එගොඩ වූ අප රබර් වත්තේ මායිමට පැමිණියෙමු. එහිදී අතපත්තුගේ කකුලේ කුඩැල්ලෙකු පිය මනිනු මම දුටුවෙමි. ඔහුට ඒ බව කී විට සින්නයියාගේ ක්‍රමය භාවිත කර ඌ පහසුවෙන් ඉවත් කළ හැකිවිය.

අපි නැවත දෙපාවල සබන් ගා ගතිමු. රබර් වත්තේ කිරි කපමින් සිටි කාන්තාවන් දෙදෙනෙකුට දෙමළ බසින් කථාකර, අසලට කැඳවා,  බුලත් විට දුන් සින්නයියා ඔවුනට

අප පෙන්වා පුරසාරමක් වැනි දෙයක් දෙමළෙන් කීවේය. ඔවුන්ද එය අනුමත කළ බව හිස සලා, අප දෙස බලා, මඳ සිනහ පෑහ.

අපට රබර් වත්තේ තිබී කිඩාරම්, පණු අල, භාතාවාරියා වැනි භූගත කඳන් සහිත ශාක රාශියක් හමුවිය. මේවා හාරා ගැනීමට සින්නයියා උදව් කළේය. රබර් වත්තේ ගල් දෙබලක් අස්සේ වැඩී තිබුණු බේඳුරු සහ තවත් වායව මීවන වර්ග කිහිපයක් ගලවා දීමට සින්නයියා සමත් විය. මේ සඳහා ඔහුට පැය භාගයක් පමණ ගතවිය. ගල් දෙබලේ විෂකුරු සර්පයින් සිටින නිසා, ඔහු අපට ඒ අසලටවත් ඒම තහනම් කළේය.

ස්ටීවන් මහතාගෙන් ලැබුණු සැන්ඩ්විච්, අපි සින්නයියා සමගද බෙදාගෙන දහවල් ආහාරය සඳහා ගතිමු. ටික වේලාවක් විවේක ගැනීමෙන් පසු, තවත් ශාක වර්ග කිහිපයක් සොයා ගැනීමට හැකිවිය. අප ආපසු පිටත් වීමට සැරසෙන විටම සින්නයියා තරමක් ඈතට ගොස්, අත්පුඩි ගසා අපට එතැනට කථා කළේය, අපි එතැනට ගියෙමු.

"මට මතෙක නති උනා. පෙරිය දොරේ මේක පෙන්නන්න  කිව්වා..."

කියා රබර් ගසක තරමක් ඉහල අතු දෙබලක

14 වන පිටට